


# වෙසක් බලන්ටා - යමු කොළොම් පුරේ




## සිසිර දිසානායක

වෙසක් බලන්ටා - යමු කොළොම් පුරේ....

කවුදෝ කකුල් දෙකටම කදිසං ඇඳගත්තු මහත්තැන් කෙනෙක් දන්සැලක් ඉස්සරහා සරුවත් රීදුරුවක් ඔලුව උඩ තියාගෙන නටනවා.

අංකල්ට සරුවත් බීලා ම සූර් වගේ... දන්සැල් වඳින්න පෝලිමේ උන්නු කවුදෝ කොල්ලෙක් කට කැඩිච්ච කතාවක් කිව්වා.

අනෙ මගෙ කට.. උන්නැහේ නැටිල්ල පැත්තක තියලා අර භාදයාගේ ජාතකය වදාරන්න පටන් ගත්තා.



මෙහෙව් තැනකවත් බෑනේ මුන්ට.. සාදුකාර දි දී තොරණේ විස්තරේ ට කන් දීගෙන හිටපු උපාසකම්මා කෙනෙක් බුලත් කෙළ පාරක් ගැහුවා. .. තූ විතරක්... නිකං හම්බවෙන පළියට බොනවා ඉතින්...

කාටද ආඩම්බර..? පින්සල පන්හිඳ දිහා බැලුවා.

කාටද ඉතින් අර භාදයාගේ මෑණියන්ට මිසක්...

ඒක නෙවෙයි මම කිව්වෙ.. ඩෝප් මරගාතේ වුණාත් අර මනුස්සයා කිව්වේ මගේ ගැට ගහපු වචන ටිකක් නේ ද? ජනප්පිරියයි එහෙනං ඈ?

එහෙනම් ඉතින් සින්දුව කියපු අතුල රංජන ළමයටත් කලිඳු වීරසිංහ ළමයටයි මොන තරම් ආඩම්බර ඇද්ද්? ඇත්තයම මට නම් දැනෙන්නේ දුකක්.. පන්හිඳගෙ ඇස් කෙවෙනි අග මතුවුණා පුංචි කඳුලු කැට තොරණේ එළියෙන් දිළිහෙනවා පින් දැක්කා. පින්ට හිතා ගන්න බෑ ඇයි මේ කියලා.

මට ඇත්තටම ලංකාවේ වෙසක් කාලය ගැන මතක් වුණා... පන් කිව්වෙ හෙමිහිට හොරෙන් කඳුලු කැට අතින් පිහගන්න ගමන්.

වෙසක් කාලයට අපි සූදානම් වෙන්නෙ මාසයකට හමාරකට කලින් ඉඳලා. සව් කොල වලට, බකට් වලට, වෙසක් කාඩ් වලට සල්ලි හොයාගන්න වෙන්නෙ සමහර විට අවුරුද්ද පුරා එකතු කරපු කැට බිඳලා.

වෙසක් කාඩ් වලට මට නම් ලොකු වියදමක් ගියේ නෑ.. අම්මා පොස්ට් කාඩ් ගෙනැල්ලා දෙනවා ඕනෑ තරම් වෙසක් කඩා ඇඳලා යවපන් කියලා.. පින් පන්ගේ කතාවට එක්වුණා. .. මම ඉතින් අනිත් අයටත් එක්ක අඳිනවා..

මට මතකයි.. මට මතකයිතත මටත් ඇඳලා එවලා තිබුණේ..

ඉතින් ඊළඟ වැඩේ තමයි ගෙවල් ගාව තිබුණ රබර් කට්ටියට පැනලා ඔට්ටපාලු එකතු කරන එක. රබර් කකට්ටිය අද්දරින් ගලාගෙන යන ඇළ පාර අයිනෙ තියෙන බට පඳුරු වලින් බට ගස් කපාගෙන එන්නෙ වෙසක් කූඩු හදන්න.. කූඩුවේ පට්ටම හදා ගන්න බට පතුරු ඕනෙ කරන හැඩ වලට තියලා ඔට්පාලු වලින් බැඳලයි.. පන් තමන්ගේ කුඩා කාලයට හිතින් ගියා.

අටපට්ටම්, තරු, නෙළුම් මල්, අහස් යාත්‍රා වාගේ හැඩ කැරකෙන කූඩු, පැටව් විදියට හදලා සව්කොල ඇලෙව්වම හරි අපූරුයි... පින්ට ඒ අතේ වැඩ හොඳට හුරුයි. පන් නම් ඉතින් ඔය දවස් වලදි බට කීරි වලට, දුණු පිහියට, බ්ලේඩ් තල වලට අත කපාගෙන පැලැස්තර කීපයක් දාගෙනමයි ඉන්නේ.. මතකද පානි පිටි පාප්ප සුවඳ..? පාප්ප ගත්තෙ සව් කොල අලවන්න. බත් ඇටත් ගන්නවා..

වෙසක් දා උදෙන්ම වැඩ පටන් ගන්නේ තම තමන් හදාපු සැරසිලි වලින් ගෙවත්ත සැරසිල්ලෙන්.. ලොකු බෞද්ධ කොඩිය මිදුලේ අඹ ගහේ ඉහළම අත්තක තාත්තා බැන්දාට අම්මාට හිතට මදි. තවත් වෙසක් කොඩි වැලක් ම මිදුලේ ගස් වටේ ට ඇදලා බඳින එකයි අම්මාගේ මුල්ම රාජකාරිය. අක්කලා නංගිලා, අයියලා මල්ලිලා එකතු වෙලා කෙරෙන මේ සැරසිලි එළිය වෙන්නෙ හැන්දෑ ජාමෙ. තාත්තා කඩෙන් ගෙනත් දෙන බකට්, මැටි පහන් පත්තු කරලා ඒවාත් මිදුල පුරා තියන්නේ එල්ලන්නෙ එක එක රටා වලට. මුළු වත්තම එළියයි. පුදුම සතුටක් හිතේ ඇති වෙන්නෙ. පන්ගේ ඇස් වල ඒ සතුට දැනුත් වෑහෙනවා. සිල් මුදවපු වැඩිහිටි ඈයෝ ආපහු ගෙදරට එන්නේ හැමොගෙම වැඳුම් පිදුම් මැද්දෙ.

ඔය දේවල් කරලා කියලා පන්සල් යන්නෙ හරිම සතුටකින්. මල්, හඳුන්කූරු සුවඳ මැද්දෙ ඇහෙන ඝන්ඨාර හඬ, හේවිසි හඬ, හෙමිහිට මිමිනෙන ගාථා හඬ අදත් පපුව ඇතුළේ දෝංකාර දෙනවා වාගේ.. පින් කතාවට අලගු තිව්වා. .. තොරණ, දන්සැල් වඳින්න යන්න අවසරේ ලැබෙන්නෙ පින් අතේ වැඩ වැඩිහිටි අයට ඒනෙ හැටියට කෙරුණොත් තමයි.

කොළොම්පුරේ වෙසක් බලන්න ගිය සන්දිය පින් - පන් දෙන්නාටම එකම මතකයක්. දෙන්නාම හිටියේ, ආවෙගියේ එකට හින්දයි ඒ. පිටකොටුවෙ, තොටළඟ, දෙමටගොඩ, බොරැග්ග වාගෙ තැන්වල තොරණ බලන්න ඒ කාලෙ ගියේ පයින්මයි. බස් තිබුණත් ඒවාගේ යන එක බොරු. ඒ තරමට සෙනග. හැබැයි ඉතින් ඩබල් ඩෙකර් එකක උඩ තට්ටුවට නැගගත්තොත් නරක නෑ..

ඒත් ඉතින් මිනිසුන්ගේ ඇගේ හැප්පි හැප්පි යන එක තරම් ගතියක් නෑ.. ගෑනු ළමිස්සියො එහෙමත් පාරට තොටට බහින කාලෙනෙ..

මතකද රත්මලානෙ කූඩුව..? පින් ඇහුවා

ඒවා කූඩු නෙවෙයි.. වෙසක් පහන් කූඩු රාජයන්. .. පන් කිව්වා. පන් ඒ කාලයේ පාරේ අයිනේ පෙන්නන වෙසක් නාට්ටියකත් රඟ පෑවා.

නොකරපු   කෙහෙල්මලක් නෑ... පන් සුසුමක් හුලඟට හැරියා.

කරපු දේකුත් නෑ අන්තිමට ඉතින්... පින් කිව්වේ අනිත්‍යය ගැන හිතලාවත් ද?

ඔලුබක්කන් නැටිලි, රූකඩ සංදර්ශන, භක්ති ගීත කණ්ඩායම් හැම තැනකම. රෑ එළි වෙනකල් ඉතින් බාරේ තමයි.

වෙසක් පෝයදා රෑට හුගක් වෙලාවට වහිනවා. අනේ ඉතින් අපි පන්සල් ගිහින් වෙසක් බලලා එනකෝට අපේ සැරසිළි වැස්සට අහුවෙලා, දියබත් වෙලා. සමහරක් ඒවා සුළඟට අහුවෙලා ඉටිපන්දම් දැල්ලට පිට්විලා ගිහින්. පන්ගේ මූණ නාටිකාංගනාවන්ගේ විප්‍රකාර දුටුව සිද්ධාර්ථ කුමාරයාගේ මූණ වගේ වෙලා.

අනිච්චේ සංසාරේ... පින්ට කියවුණා.

| | |
|---|---|
| මල්ලී | වෙසක් බලන්ටා යමු<br>කොළොම් පුරේ |
| අයියා | මලේ ඉතින් පරිස්සමින්<br>මතකද ගිය වාරේ |
| මල්ලී | නේක හැඩේ කූඩු වගේ<br>ගෑණු ළමයි හැම අතේ<br>ඉසව් නිනව් නැතිව ගියා<br>කවට සිනා මුකුලුවේ |
| අයියා | වීදි පුරා මං සෙව්වා<br>රැය ගෙවුණයි දන්සැල් ගානේ |
| අයියා | හෝ ගානා පොකුණ වගේ<br>මහා සෙනඟ පිරිවරේ<br>මඩිස්සලෙත් දන් දුන්නා<br>තද බද වී පෙරහැරේ |
| මල්ලී | තොරණ පුරා තරු පෙනුණා<br>වෙසක් ද මේ කොළොම් පුරවරේ |

**ගායනය** අතුල රංජන/කලිඳු වීරසිංහ
**සංගීතය** රෝහණ වීරසිංහ

ගොඩගේ ප්‍රකාශකයන් විසින් තෝරාගෙන ප්‍රකාශිත සිසිරගේ කුරුටු ගී ග්‍රන්ථයේ 84 වන පද රචනය.

# සන්නසට සෙනෙහසින්

**සයිප්‍රසයේ සොඳුරු පුවත් පතින්**

ඔයත් එහෙනම් අපව බලන්න ආවා. මොන තරම් සතුටක් ද? අපිත් බොහොම කැමැත්තෙන් උන්නෙ ඔයාලව දැන හඳුනාගන්න. දුක සැප බෙදා ගන්න. මුල ඉඳන් අගට යනකල් සන්නස හොඳට කියවලා බැලුවා. ඔයාලා හරි ඉහළයි. අපි පහලයි කිව්ව එහෙම නෙවෙයි. අපි යන්නේ එක පාරක. ඔයාල යන්නෙ තව පාරක. ඒත් අපේ ඉලක්කය එකයි. ඒකනෙ ඉතින් මේ කොහෙ හරි මංසලකදි අපි අපට හමුවුණේ.

ඔක්කොටම කලින් කියන්නෙ සන්නස ට වසරක් පිරුණ බව සංක්‍රමණිකයෙකුගෙ සටහන තුළින් දැක්කා. අපෙනුත් සුබ පැතුම්. අපිත් වර්ෂයක් පූර්ණ කරනවා ජූනි මාසයට. හිතාගන්නවත් බෑ. බත්තර දැවැන්තයන් අතර අපි වගේ පුංචි මිනිස්සු කොහොම ඉහ ගහගෙන ආවද කියලා.. තරගයක් තිබුනෙ නෑනෙ ඉතින් අරමුණක් මිසක.

ඒ වුණත් කියන්න දෙයක් තියෙනවා. මෙහෙත් බලපුලුවන්කාර අය ඉන්නවා. අපට පුලුවන් විදියට අපි එයාල ගැනත් අමතක නොකර අපේ පිටුවල ඉඩක් වෙන් කරනවා. ඒත් අද වෙනකල් නිකමටවත් එයාල අපිට එයාලගෙ සව්මත් දෑත් දිගු කරලා නැහැ. අපි මේක පටන්ගත්තෙ කාගෙවත් අත්වාරු බලාගෙන නෙවෙයි. ඒත් එහෙම සහයෝගයක් වෙළඳ දැන්වීමකින් වත් අපට ලැබෙනවා නම් ෆ්‍රෑෑ (ෆ්‍රී) කියලා ගහලා හරි ආසාවෙන් අපටත් අපේ සොඳුරු පත්තරේ නිකම් බෙදන්න තිබුණා. ඒකට උන්නට හිත් වෙනස්. ඒක මේ ලෝකෙ හැටි නේද? කොටින්ම කිව්වොත් ලෝකය වටින් ඉඳන් ඔයාල අපි ගැන ආඩම්බර වෙන තරමට මේකෙ ඉන්න අප අපව ගනන් ගන්නෙවත් නැහැ.

සන්නසට ජය .. දිගුකල් වැජඹේවා...

# කවි කොළය

උද්දමනයෙන් ජීවන වියදම වැඩි වී
මැතිවරු ඇමතිවරු විඳි දුක දැකපු ගමන්
ඇරියස් සමග පඩි වැඩිකළ පුවත ගැන
ගරු රජ සබාවට මගෙ කවි උපහාරේ

මේ උත්තමයො ටික කුළු පොලු පහර කකා
වැඩි පඩි ඉල්ලලා කර අකුරටම වැඩ
පිකටින් කළා නම් ලිප්ටන් වට රවුමේ
හත් දෙයියනේ මොන දෙයියට කියන්නද

**වෙත්තසිංහ**